# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 48 දරන
# නගර සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 දෙසැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 දෙසැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 90 යි　　　　තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 48 දරන නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 දෙසැම්බර් මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 51/82

**නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මෙම පනත 1984 අංක 48 දරන නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) නගර සභා ආඥාපනතේ 36 වන වගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **255 වන අධිකාරයේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(අ) අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම සහ කලින් කල එබඳු යම් නිලධරයකු හෝ සේවකයකු අස් කිරීම සහ යම් ධුරයකට හෝ සේවයකට, සභාවට සුදුසු යයි පෙනී යා හැකි වැටුපක්, දීමනා හෝ පාරිශ්‍රමිකයක් වෙන් කිරීම :

එසේ වුවද ඉහත කී විධිවිධාන, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවයේ සාමාජිකයකු වන හෝ සාමාජිකයකු වන්නේ යයි සලකනු ලබන ඒ සභාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට සහ එවැනි යම් නිලධරයකු හෝ සේවකයකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ "රුපියල් එක් දහසක් ඉක්මවන වියදමක්" යන වචන වෙනුවට "රුපියල් දස දහසක් ඉක්මවන වියදමක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් පන්සියයක් ඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දස දහසක් ඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් එක් දහසක් ඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දස දහසක් ඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ද, "රුපියල් විස්සකට නොවැඩි වැඩිපුර දඩයකින් ද" යන වචන වෙනුවට "රුපියල් දෙසියයකට නොවැඩි වැඩිපුර දඩය කින්ද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2—ඒ 080179—7,275 (84/11)

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් දහයකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් එක් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඈ) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය යටතේ අල්ලා ගනු ලබන කිසිම සතෙකු, ඒ සතා අල්ලා ගනු ලැබුවේ කවර තැනැත්තකු විසින් ද ඒ තැනැත්තාගේ ප්‍රයෝජනය සඳහා ද, ඒ සතා කොටුවේ තබාගෙන සිටියා වූ එක් එක් දිනය සඳහා ද, සභාව විසින් ප්‍රාදේශීය තත්වයන් සැලකිල්ලට ගෙන කලින් කලට යෝජනාවක් මගින් නියම කරනු ලැබිය හැකි යම් මුදලක් ගෙවනු ලැබුවහොත් මිස, ඒ සතාගේ අයිතිකරුට භාර නොදිය යුතුය."; සහ

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් දෙකක්" යන වචනවල සිට "ගෙවනු ලැබීමෙන් පසුව" යන වචන දක්වා ඇති කොටස ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"එම සතා අල්ලා ගනු ලැබූ තැනැත්තා වෙත සහ ආරක්ෂක භාරකාරත්වය සහ නඩත්තුව වෙනුවෙන් සතා කොටුවේ තැබීමට යෙදෙන එක් එක් දිනයක් සඳහා සභාව විසින් ප්‍රාදේශීය තත්ත්වයන් සැලකිල්ලට ගෙන, කලින් කලට යෝජනාවක් මගින් නියම කරනු ලබන යම් මුදලක් ගෙවනු ලැබීමෙන් පසුව,".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියෙ 92 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පහක් වූ දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පනහක් වූ දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් දහයකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් එක් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 127අ, 127ආ, 127ඇ, 127ඈ සහ 127ඉ යන අළුත් වගන්ති ඇතුළත් කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 127 වන වගන්තියට ඉක්බිතිවම, පහත සඳහන් අළුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර ඒවා, ප්‍රධාන ප්‍රඥප්තියේ 127අ, 127ආ, 127ඇ, 127ඈ සහ 127ඉ වගන්ති වශයෙන් බලාත්මක වන්නේය :—

"ළමයකු විසින් කරන පීඩාව.

127අ. වයසින් අවුරුදු දොළහකට අඩු ළමයකු රැක බලා ගන්නා හෝ ඔහුගේ භාරකාරත්වය දරන සෑම තැනැත්තකුම, ඒ ළමයා විසින් යම් වීථියක හෝ එහි අසෙක හෝ පීඩාවක් කිරීම නොවළක්වන්නේ නම්, ඒ සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

පොදු නාන ස්ථාන.

127ආ. (1) නෑම හෝ සතුන් හෝ රෙදි සේදීම සඳහා වෙන් කරනු ලැබ නැති යම් පොදු ස්ථානයක හෝ දැන්වීමේ සඳහන් කරන ලද වේලාවන් හෝ තැනැත්තන් හැර වෙනත් වේලාවන් තුළ හෝ තැනැත්තන් විසින් නෑම හෝ සතුන් හෝ රෙදි සේදීම සහ පොදු ස්ථානයන්හි ජලය කවර අන්දමකින් හෝ අපවිත්‍ර කරන හෝ ඒ ජලය පාවිච්චියට අහිතකර හෝ නුසුදුසු කරන සියලු ක්‍රියාවන් හෝ නාන ස්ථාන හෝ රෙදි සෝදන ස්ථාන පාවිච්චි කරන තැනැත්තන්ට හිරිහැරයක් හෝ හිංසාවක් සිදු කරන ක්‍රියාවන්, ප්‍රසිද්ධ දැන්වීමක් මගින් සභාව විසින් තහනම් කරනු ලැබිය හැකි ය. ඒ දැන්වීම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ගැසට් පත්‍රයෙහි සහ යටත් පිරිසෙයින් එක් සිංහල පුවත්පතක, එක් දෙමළ පුවත්පතක සහ එක් ඉංග්‍රීසි පුවත්පතක ද පළ කරනු ලැබිය යුතු ය.

(2) (1)වන උපවගන්තියට පට හැනිව නාන, සෝදන හෝ යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු, රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

ජලාශවලට හෝ ජල කර්මාන්ත වලට ගලා යන ඇලවල් අපවිත්‍ර කිරීම.

127ඇ. යම් නගර සභාවකට අයත් ජලකර්මාන්තයක කාර්ය සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ජලාශයක හෝ එවැනි යම් ජලාශයකට ජලය ගලා යන්නා වූ හෝ ජලය එක් රැස් කරන්නා වූ යම් ඇලක හෝ ජල මාර්ගයක නාන හෝ රෙදි හෝ වෙනත් යම් දෙයක් සෝදන නැතහොත් එවැනි ජලාශයකට, ඇලකට හෝ ජල මාර්ගයකට කුණු රොඩු, ඉවතලන ද්‍රව්‍ය හෝ අපවිත්‍ර ද්‍රව්‍ය ගලායාමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් එය අපවිත්‍රවීමට හෝ අපිරිසිදු ද මිශ්‍ර වීමට ඉඩ හරින සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට ද අඛණ්ඩව කරන වරදක් සම්බන්ධයෙන් වන විට, එසේ අඛණ්ඩව වරද කිරීම ගැන වරදකරු කරනු ලැබීමෙන් හෝ ඒ වරද ගැන අවධානය යොමු කරමින් සභාවෙන් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබූ දිනට පසු වරද අඛණ්ඩව කරන එක් එක් දිනයක් සඳහා රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

කර්මාන්තශාලා වලින් සිදුවන අපවිත්‍රවීම.

127ඈ. (1) අසල්වාසීන්ගේ සෞඛ්‍යයට හානි කරවන හෝ අහිතකරවන ලෙසින් අපවිත්‍රවීම සිදු වන ආකාරයෙන් යම් නගර සභාවක පාලන සීමාව තුළ යම් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යාමට සලස්වන යම් තැනැත්තකු වරදකට වරදකරු වන්නේය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදකට, ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අවස්ථාවක ඒ කර්මාන්ත ශාලාව නිසා සිදු වන අපවිත්‍රවීමේ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්—

(අ) ඒ කර්මාන්තශාලාව පිහිටි ස්ථානය වෙනුවෙන් මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා ගෙවිය යුතු වන ගාස්තුව මෙන් දෙගුණයකට සමාන දඩයක්, ඒ දඩයේ ප්‍රමාණය සිය සාමාන්‍ය අධිකරණ බලය පාවිච්චි කිරීමේ දී මහෙස්ත්‍රාත්වරයකු විසින් පැන විය හැකි දඩයේ ප්‍රමාණය ඉකුත් කරන්නේ වී නමුදු, පනවනු ලැබීම ද, එසේ අය කර ගනු ලබන මුදල සභාවේ අරමුදලට ගෙවනු ලැබීම ද, නැතහොත්

(ආ) ඒ කර්මාන්තශාලාව පවත්වාගෙන යාම නතර කරනු ලැබීම ද

සඳහා ආඥා කරනු ලැබිය යුතු ය.

තැනැත්තකුගේ හෝ දේපළක ආරක්ෂාවට තර්ජනයක් වන ගස් හෝ ගස්වල අතු හෝ කඳන් හෝ ගෙඩි සම්බන්ධයෙන් නගර සභාවක සභාපතිවරයකුගේ බලතල.

127ඉ. (1) යම් නගර ප්‍රදේශයක් තුළ වූ යම් ගස කින්, ගසක යම් අත්තකින්, කඳකින්, ගෙඩිය කින් හෝ වෙනත් කොටසකින් යම් ගොඩනැගිල්ල කට අලාභහානියක් සිදුවන හෝ සිදු වීමට ඉඩ ඇති අවස්ථාවක නැතහොත් එය, යම් ගොඩනැගිල්ලක පදිංචි කරුවන්ට අන්තරාදායක ලෙස හෝ යම් ප්‍රසිද්ධ මහා මාර්ගයක ගමන් කරන්නන්ගේ ආරක්ෂාවට අන්තරාදායක තත්වයක පවතින අවස්ථාවක, ඒ ප්‍රදේශයේ සභාවේ සභාපතිවරයා විසින්, ඒ ගස පිහිටියා වූ ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලිඛිත දැන්වීමක් විසින්, ඒ ගස පිහිටියා වූ ඉඩමේ අයිතිකරු හෝ ඇතුළත, ඒ ගස, ඒ ගසේ අත්ත, කඳ, ගෙඩිය හෝ වෙනත් කොටස ආරක්ෂිතව බැඳ තැබීමට හෝ කපා ඉවත් කිරීමට, ඒ අයිතිකරුට හෝ පදිංචි කරුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ සෑම තැනැත්තකුම විසින්, ඒ දැන් වීමේ නියම කර ඇති කාලය තුළ එහි නියමයන් ඉටු කරනු ලැබිය යුතු අතර, ඒ කාලය ඇතුළත ඒ නියමයන් ඉටු කිරීම ඒ තැනැත්තන් විසින් ප්‍රතික්ෂේප කරන හෝ අතපසු කරන අවස්ථාවක් වේ නම්, එවැනි අවස්ථාවක, සභාපතිවරයා හෝ සභා පතිවරයා විසින් ලියවිල්ලකින් ඒ සඳහා බලය පවරන ලද යම් නිලධරයකු හෝ කම්කරුවකු ඒ දැන්වීමේ සඳහන් ඉඩමට ඇතුල් වී, ඒ නිවේදන යෙන් ඒ තැනැත්තාට කරන්නට නියම වී තිබූ දෙය කරනු ලැබිය හැකි අතර, ඒ වෙනුවෙන් දරන්නට සිදුවන වියදම්, සභාවට අයවිය යුතු ණයක් ලෙස සලකා ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය හැකි ය.

127ආ වගන්තියේ, 127ඇ වගන්තියේ සහ 127ඈ වගන්තියේ කාර්ය සඳහා " අපවිත්‍රවීම " යන්නෙන්, මහජන සෞඛ්‍ය ආරක්ෂාවට හෝ ශුභසිද්ධියට නැතහොත් සතුන්ට, පක්ෂීන්ට, වන සතුන්ට මසුන්ට හෝ ජලජ ජීවීන්ට නැතහොත් වෘක්ෂලතා දියට අනතුරුදායක හෝ අනතුරුදායක විය හැකි තත්වයක් ඇති කර වීමට යම් අභිවෘද්ධිදායක ප්‍රයෝජනයට ගැනීමකට අහිතකර ලෙස බලපාන අන්දමින්, ඉවත ලන ද්‍රව්‍ය, පිට කිරීමෙන්, දැවීමෙන් හෝ තැන්පත් කිරීමෙන් පරිසරයේ කවර හෝ

කොටසක භෞතික, තාප, රසායනික, ජෛවිය හෝ විකිරණශීලී ගුණාංගවල කෙලින්ම හෝ වෙනත් ආකාරයකින් කෙරෙන යම් වෙනස් කිරීමක් අදහස් වේ."

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් සියයකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට නොවැඩි දඩයකින්" යන වචන ද "රුපියල් පණහක් වූ තවත් දඩයකින් ද" යන වචන වෙනුවට "රුපියල් පන් සියයක් වූ තවත් දඩයකින් ද" යන වචනද ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය පහත සඳහන් ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) එහි (ඊ) ඡේදයේ "මුළු එකතුව රුපියල් දෙ දහසකට වැඩි නොවන" යන වචන වෙනුවට "මුළු එකතුව රුපියල් පන් දහසකට වැඩි නොවන" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) එහි (උ) ඡේදයේ "මුළු එකතුව රුපියල් එක් දහසකට වැඩි නොවන" යන වචන වෙනුවට "මුළු එකතුව රුපියල් දෙ දහස් පන් සියයකට වැඩි නොවන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(iii) එහි (ඌ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(එ) නගර සභා සම්මේලනයට නගර සභාව විසින් යම් වර්ෂයක් තුළ ගෙවිය යුතු, මුළු එකතුව රුපියල් එක් දහසකට හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන අන් ප්‍රමාණයක මුදලකට වැඩි නොවන මුදලක් ද.".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් එක සියයකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 168 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 168 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 169 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 169 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 181 වන වගන්තිය සංශෝධනය කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 181 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් සියයකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට නොවැඩි දඩයකින්" යන වචන ද "රුපියල් පනහකට නොවැඩි තවත් දඩයකින් ද" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි තවත් දඩයකින් ද" යන වචන ද ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 209 වන වගන්තිය සංශෝධනය කිරීම.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 209 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 219 වන වගන්තිය සංශෝධනය කිරීම.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 219 වන වගන්තිය, ඒ වගන්තියේ "ඒ වරද සිදු කිරීමෙන් පසු ඊළඟ තුන් මාසය ඇතුළත" යන වචන වෙනුවට "ඒ වරද සිදු කිරීමෙන් පසු ඊළඟ හය මාසය ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 225 වන වගන්තිය සංශෝධනය කිරීම.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 225 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකට හෝ තුන් මසකට නොවැඩි යම් කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට ද" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට හෝ හය මසකට නොවැඩි යම් කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමට ද" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 226 වන වගන්තිය සංශෝධනය කිරීම.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 226 වන වගන්තිය, ඒ වගන්තියේ "රුපියල් පනහකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 227 වන වගන්තිය සංශෝධනය කිරීම.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 227 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින්" යන වචන වෙනුවට, "රුපියල් පන් දහසකට නොවැඩි දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 229 වන වගන්තිය ඉවත් කිරීම.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 229 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.